# රජයේ නිවේදන

## 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

### 3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙහි උපලේඛනයෙහි I, II හා III වන තීරුවේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම භාණ්ඩයක් මතම ඊට අනුරූපව මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2016.12.07 දින සිට ගෙවිය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016.12.06 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දීය.

## උපලේඛනය

| *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* **I** | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* **II** | *විස්තරය* **III** | *නිෂ්පාදන බද්ද* **IV** |
|---|---|---|---|
| **87.04** | | බඩු ප්‍රවාහනය කිරීම සඳහා වූ මෝටර් වාහන | |
| | | | |
| | 8704.21.31 | ජාතික උපබෙදුම් 8704.21.43 හි වාහන, අවුරුදු හතරකට වඩා නොපැරණි | ඒකකයට රු. 1,000,000/- |
| | 8704.21.35 | ජාතික උපබෙදුම් 8704.21.63 හි වාහන, අවුරුදු හතරකට වඩා නොපැරණි | ඒකකයට රු. 1,000,000/- |
| | 8704.31.31 | ජාතික උපබෙදුම් 8704.31.43 හි වාහන, අවුරුදු හතරකට වඩා නොපැරණි | ඒකකයට රු. 1,000,000/- |
| | 8704.31.35 | ජාතික උපබෙදුම් 8704.31.63 හි වාහන, අවුරුදු හතරකට වඩා නොපැරණි | ඒකකයට රු. 1,000,000/- |